**ශීර්ෂය 207 - පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 207 - පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 09 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 09 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.1 (ආ) | දේපළ වල අයිතිය දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. | 3.8 (එ) |

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | බණ්ඩාරවෙළ දිසා අධිකරණයේ පවරන ලද අංක M 4251 දරන නඩුව මඟින් පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු 04 දෙනෙකු වගඋත්තරකරුවන් කරමින් එක් අයෙකුගෙන් රුපියල් කෝටි 07 බැගින් වන්දි මුදලක් ඉල්ලා 2016 වර්ෂයේදී බණ්ඩාරවෙල මහේස්ත්‍රාත් අධිකරණයේ පවරා ඇති M 4251 දරන නඩු කටයුත්තට අදාළව දෙපාර්තමේන්තුවට ඇති අසම්භාව්‍ය බැරකම් සම්බන්ධයෙන් අවශ්‍ය හෙළිදරව් කිරීම් කර නොතිබුණු බව නිරීක්ෂණය විය | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විත්තිකරුවන් ලෙස නම් කර වන්දි නඩු පවරා ඇත්තේ මීට වසර 15 කටත් පමණ පෙරය. දැනට නිරීක්ෂණය වන කරුණු අනුව මෙවැනි ආකාරයේ නඩු පෙර අවස්ථාවලදී පවරා නොමැති අතර ඒ හේතුව මත මේ සම්බන්ධයෙන් නීති නිලධාරීන් හට අත්දැකීම් නොමැති බවත්, එසේ වීම තුළින් අසම්භාව්‍ය බැරකම් පිළිබඳව ගිණුම් අංශය වෙත දැනුම් දීමට නොහැකි වූ බවත් නීති අංශය විසින් මා වෙත දන්වා ඇත. කෙසේවුවත් මෙවැනි ආකාරයේ නඩු පැවරීම් ඉදිරි කාලය තුළදී සිදුකළ හොත් ඒ බව ගිණුම් අංශය වෙත දැනුම් දීමට අපේක්ෂා කරන බව නීති නිලධාරී විසින් මා වෙත වාර්තා කර ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37 අනුව මූල්‍ය ප්‍රකාශනවල සටහන් මඟින් අසම්භාව්‍ය බැරකම් අනාවරණය කළ යුතු බව. |
| (ii) | මාතර දිසා අධිකරණයේ පවරන ලද අංක M 13703 දරන නඩුව මඟින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ගවේෂණ නිලධාරීවරයෙක්, පර්යේෂණ නිලධාරීන් දෙදෙනෙකු, ග්‍රාම නිලධාරීවරයා සහ නීතිපතිවරයා වගඋත්තරකරුවන් ලෙස නම් | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විත්තිකරුවන් ලෙස නම් කර වන්දි නඩු පවරා ඇත්තේ මීට වසර 15 කටත් පමණ පෙරය. දැනට නිරීක්ෂණය වන කරුණු අනුව මෙවැනි ආකාරයේ නඩු පෙර අවස්ථාවලදී | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37 අනුව මූල්‍ය ප්‍රකාශනවල සටහන් මඟින් අසම්භාව්‍ය බැරකම් අනාවරණය කළ යුතු බව. |

| | | |
|---|---|---|
| කරමින් එක් අයකුගෙන් රුපියල් ලක්ෂ 10 බැගින් වන්දි මුදලක් ඉල්ලා තිබුණි. වසර 07 ක කාලයක් තිස්සේ පැවත එන මෙම නඩුවට අදාළව දෙපාර්තමේන්තුවට ඇති අසම්භාව්‍ය බැරකම් සම්බන්ධයෙන් අවශ්‍ය හෙළිදරව් කිරීම් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | පවරා නොමැති අතර ඒ හේතුව මත මේ සම්බන්ධයෙන් නීති නිලධාරීන් හට අත්දැකීම් නොමැති බවත්, එසේ වීම තුළින් අසම්භාව්‍ය බැරකම් පිළිබඳව ගිණුම් අංශය වෙත දැනුම් දීමට නොහැකි වූ බවත් නීති අංශය විසින් මා වෙත දන්වා ඇත. කෙසේවුවත් මෙවැනි ආකාරයේ නඩු පැවරීම් ඉදිරි කාලය තුළදී සිදුකළ හොත් ඒ බව ගිණුම් අංශය වෙත දැනුම් දීමට අපේක්ෂා කරන බව නීති නිලධාරී විසින් මා වෙත වාර්තා කර ඇත. | |

**1.6.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබද සැසැඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලද 2022 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ ශේෂ එකතුව රු.110,677,158 ක් වූ අතර, ණය පාලන ගිණුමේ ශේෂය රු.111,084,342 ක් විය. ඒ අනුව එම ශේෂ අතර රු.407,184 ක වෙනසක් තවදුරටත් නිරීක්ෂණය විය. | නිවැරදිය. මූල්‍ය අංශයේ නිලධාරීන්ගේ ඌනතාවයන් නිසා විෂයයන් කිහිපයක් එක් නිලධාරියෙකුට පැවරී ඇත. එසේම පවතින මූල්‍ය ක්‍රමවේදයන් විධිමත් කිරීමේ ක්‍රියාවලීන් ඉටුකරමින් පවතින නිසා අතීත වැරදි සෙවීමට කාලය වැයකිරීම ඉතා අසීරු වී ඇත. කෙසේවුවද වෙනස සොයමින් පවතී. | කේවල ශේෂ ලේඛනය සහ ණය පාලන ගිණුම අතර පවතින මෙම වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට ක්‍රියා කළ යුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වැය විෂයයන් 07 කට අදාළව සියයට 60 සිට සියයට 100 දක්වා පරාසයක් තුළ රු.12,211,683 ක ප්‍රතිපාදන ඉතිරිවී පැවතිණි. | විගණන විමසුමේ සඳහන් අයුරින් ඇස්තමේන්තු අධි ගණනයක් සිදුවී නොමැති අතර පහත සඳහන් වගුවේ අවසන් තීරයේ දැක්වෙන හේතු මත | ඇස්තමේන්තු සැකසීමේ කටයුතු මනා සැලකිල්ලකින් යුතුව ඉටු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | | ප්‍රතිපාදන වියදම් කිරීමට නොහැකි වීමෙන් ප්‍රතිපාදන ඉතිරියක් ඇති වී ඇති බව කාරුණිකව දැනුම් දෙමි. | |
| (ආ) | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පරිගණකගත ලෙජරයේ පවතින Ambassador Fund for Cultural Preservation නම් වූ ලෙජර් ගිණුම යටතේ එකතුව රු.7,125,443 ක්ද, Rajagala Archaeological Reserve – FHSS නම් වූ ලෙජර් ගිණුම යටතේ එකතුව රු.4,971,012 ක්ද සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුම තුළ 2014 වර්ෂයේ සිට ඉදිරියට රැගෙන එන ලද එකතුව රු.5,076,893 ක්ද ව්‍යාපෘති කාර්යයන් සඳහා භාවිතයට නොගෙන 2022 දෙසැම්බර් 31 දින වන විටත් ඌන උපයෝජිතව ගිණුම් තුළ පැවති බව නිරීක්ෂණය විය. | පොදු තැන්පත් ගිණුම තුළ 2014 වර්ෂයේ සිට ඉදිරියට රැගෙන එන ලද මුදල වන රු. 5,076,893 ක මුදල මෙම වර්ෂයේ වියදම් කිරීමට නියමිතය. | පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන ඇති මුදල් අදාළ කාර්යයන් නිම කිරීම සඳහා භාවිතා කළ යුතුය. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | තැපැල් දෙපාර්තමේන්තුව සතු ලොරි රථ 03 ක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත 2020 ජූනි 23 දින පවරාගෙන තිබුණ අතර, එම ලොරි රථ තැපැල් දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික ඉංජිනේරු මහතාගේ අධීක්ෂණය හා නිර්දේශයට අනුව දේශීය නියෝජිත ආයතනය වෙතින් මිල ඇස්තමේන්තු කැඳවා රු.4,614,777 ක මුදලකට අළුත්වැඩියාවන් සිදු කිරීම 2021 දෙසැම්බර් 31 දින වන විටත් නිම කර පැවති නමුත්, 2023 මාර්තු 15 විගණන දින දක්වාත් අදාළ බිල්පත් පියවා වාහන 03 දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමටත් යථෝක්ත | අතපසුවීමකින් බැරකම් ලේඛනයේ සටහන් කිරීමට නොහැකි වී ඇති අතර ඉදිරියේදී මෙවැනි අතපසුවීම් වළක්වා ගැනීමට සටහන් කරගත් බව කාරුණිකව දැනුම් දෙමි. | වර්ෂයට අදාළ සියළුම බැඳීම් හා බැරකම් ප්‍රමාණයන් පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනයේ බැඳීම් හා බැරකම් තුළ ඇතුළත් කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | මුදල ගෙවිය යුතු මුදලක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනයේ බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය තුළ ඇතුළත් කිරීමටත් කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | 207-1-1-0-1301 හා 207-2-2-0-1301 වාහන නඩත්තු වියදම් වැය විෂයයන් යටතේ පිළිවෙලින් වියදම් දරා අතැති බිල්පත් වශයෙන් පවතින රු.2,856,215 හා රු.709,283 ක් මුදල් රෙගුලාසි 94 (2) සහ (3) ප්‍රකාරව එළඹෙන බැරකම් වශයෙන් බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය තුළ හෙළිදරව් කර නොතිබුණි. | අතපසුවීමකින් බැරකම් ලේඛනයේ සටහන් කිරීමට නොහැකි වී ඇති අතර ඉදිරියේදී මෙවැනි අතපසුවීම් වළක්වා ගැනීමට සටහන් කරගත් බව කාරුණිකව දැනුම් දෙමි. | බැඳීම් හා බැරකම් ප්‍රකාශනය තුළ වර්ෂයට අදාළ බැරකම් නිවැරදිව ඉදිරිපත් කළ යුතු වේ. |

## 2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2022 වර්ෂයට අදාළව ප්‍රකාශය ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතින අතර ඉදිරි වර්ෂ සඳහා නියමිත දිනයන්ට අනුකූලව අදාළ වාර්තා යොමුකිරීමට සටහන් කර ගත් බව කාරුණිකව දන්වමි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **(i)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | • මුදල් රෙගුලාසි 104 (3) | WPPG – 4006 දරන කැබ් රථයේ 2018 ඔක්තෝම්බර් 09 දින රාත්‍රී 12.00 ට සිදු වූ හදිසි අනතුර පිළිබඳව පොදු 283 ආකෘතියෙන් ප්‍රාරම්භක වාර්තාව පිළියෙල කර නොතිබීම. | ගොනු පරීක්ෂාවේදී වාර්තා පිළියෙළ කර නැති බව නිරීක්ෂණය වේ. මෙය 2018 වර්ෂයේ සිදු වූ අනතුරක් නිසා ගොනුව අධ්‍යයනය කිරීමෙන් පසුව මෙම අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව කාරුණිකව දැනුම් දෙමි. | මුදල් රෙගුලාසි අනුව ක්‍රියා කළ යුතුය. |
| | • මුදල් රෙගුලාසි 104 (4) | WPPG – 4006 දරන කැබ් රථයේ 2018 ඔක්තෝම්බර් 09 දින රාත්‍රී 12.00 ට සිදු වූ හදිසි අනතුර පිළිබඳව පොදු 284 ආකෘතියෙන් පූර්ණ වාර්තාව පිළියෙල කර නොතිබුණි. | ගොනු පරීක්ෂාවේදී වාර්තා පිළියෙළ කර නැති බව නිරීක්ෂණය වේ. මෙය 2018 වර්ෂයේ සිදු වූ අනතුරක් නිසා ගොනුව අධ්‍යයනය කිරීමෙන් පසුව මෙම අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව කාරුණිකව දැනුම් දෙමි. | මුදල් රෙගුලාසි අනුව ක්‍රියා කළ යුතුය. |
| **(ii)** | 2008 ඔක්තෝම්බර් 20 දිනැති අංක 1572/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය | ගැසට් පත්‍රය ප්‍රකාරව හඳුන්වාදී තිබෙන ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය ඉටු කර නොමැති බව නිරීක්ෂණය විය. | 2008 ඔක්තෝම්බර් 20 දිනැති අංක 1572/4 ලේඛනය මඟින් ශ්‍රී ලංකාවේ ජාතික පුරාවිද්‍යාත්මක ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ රාමුවක් විස්තර කර දී පැවති නමුත්, මෙතෙක් දෙපාර්තමේන්තුව තුළ යථෝක්ත ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2011 ජනවාරි 18 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශ අංක NH/05/2011 මගින් පුරාවිද්‍යාත්මක ස්ථානවල නඩත්තුව හා කළමනාකරණය සඳහා පුරාවිද්‍යා උරුම කළමනාකරණ භාරය නමින් අරමුදලක් පිහිටුවීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත සංදේශයක් ඉදිරිපත් කර තිබුණි. මේ සඳහා 2011 පෙබරවාරි 10 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 11/0169/555/004 මගින් ලබාදුන් අනුමැතිය අනුව මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් උපයනු ලබන ආදායමින් සියයට 25 ක් සංදේශයේ සඳහන් අරමුණු වෙනුවෙන් ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයට ලබාදිය යුතු බව සඳහන් විය. එහෙත් 2022 දෙසැම්බර් 31 දින වනතුරුත් මධ්‍යම සංස්කෘතික අරමුදලට ලැබෙන මුදලින් අදාළ අරමුදල පිහිටුවීමට අවශ්‍ය ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් ඉදිරි කටයුතු කිරීමට නොහැකි වී පැවති බව නිරීක්ෂණය විය. | මධ්‍යම සංස්කෘතික අරමුදලෙන් අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ලැබිය යුතු මුදල් නොලැබීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ ගවේෂණ, කැණීම් හා සංරක්ෂණ කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යා නොහැකි වීම හේතුවෙන් පුරාවිද්‍යා ස්ථාන කිහිපයක් දැඩි තර්ජනයකට මුහුණ දී ඇත. | 2011 පෙබරවාරි 10 දිනැති අංක 11/0169/555/004 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව කටයුතු කළ යුතුවේ. |
| (ආ) | අම්පාර ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂ කාර්යාලය යටතේ පවතින නීලගිරිය සෑය ප්‍රතිනිර්මාණ කටයුතු ආරම්භ කර දිගුකාලයක් ගතවී පැවති අතර, විගණන අවස්ථාව වන විට දෙපාර්තමේන්තු ගවේෂණ අංශ නිලධාරීන් විසින් ස්ථූපය හා ඒ ආශ්‍රිත නටඹුන් සංකීර්ණය හඳුනා ගැනීම සඳහා ගවේෂණය සිදු කර අවසන් වී පැවති අතර, රක්ෂිතයක් ලෙස වෙන් කිරීම සඳහා මායිම් නිරවුල් කිරීම සිදුකර පැවති නමුත්, මායිම් කණු යෙදීම හෝ මැනුම් කටයුතු සිදු කර පුරාවිද්‍යා ස්ථානයක් ලෙස ගැසට් කර නොතිබුණි. | නීලගිරි ස්තූපය හා ඒ ආශ්‍රිත නටබුන් සංකීරණය හඳුනාගැනීම සඳහා ගවේෂණ සිදුකර අවසන් වී ඇත. ඒ අනුව පසුගිය වර්ෂයේදී අම්පාර පුරාවිද්‍යා කාර්යාලයේ නිලධාරීන් විසින් නීලගිරි ස්තූපය හා ඒ ආශ්‍රිත නටබුන් භූමිය පුරාවිද්‍යා රක්ෂිතයක් ලෙස වෙන්කිරීම සඳහා මායිම් නිරවුල් කර ඇත. මෙම වසරේදී මූල්‍ය ප්‍රතිපාදන වෙන්වුවහොත් එම භූමිය වටා මායිම් කණු යෙදීමෙන් පසුව මැනුම් කටයුතු සිදුකිරීමට අපේක්ෂිත බව කාරුණිකව දන්වා සිටිමි. | නීලගිරි ස්ථූපය හා ඒ ආශ්‍රිත නටඹුන් භූමිය පුරාවිද්‍යා රක්ෂිතයක් ලෙස ගැසට් කිරීමේ කාර්ය සඳහා අවධානය යොමු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රජගල පුරාවිද්‍යා භූමියට අයත් අක්කර 1025 න් පියංගල රක්ෂිතයට අදාළ කොටස ඉවත් කිරීමෙන් පසු ඉතිරි රජගල පුරාවිද්‍යා ව්‍යාපෘතියට අයත් භූමි ප්‍රමාණය දැනට මැනුම් කටයුතු අවසන් කර පැවති නමුත්, 2023 මාර්තු 20 දින දක්වා මායිම් කණු යොදා නොතිබුණු අතර, වෙන් කළ පුරාවිද්‍යා භූමියක් ලෙස මිනින්දෝරු දෙපාර්තමේන්තුව මඟින් සකස් කළ ගම් පිඹුරේ සටහන් වී පැවති නමුත්, මෙම පුරාවිද්‍යා භූමිය පුරාවිද්‍යා රක්ෂිතයක් ලෙස ගැසට් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | රජගල පුරාවිද්‍යා රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත්නොකළ ද එය වෙන්කළ පුරාවිද්‍යා භූමියක් ලෙස මිනින්දෝරු දෙපාර්තමේන්තුව මඟින් සකස් කළ ගම් පිඹුරේ සටහන් වී ඇති බව කාරුණිකව දන්වමි. | රජගල පුරාවිද්‍යා ව්‍යාපෘතියට අයත් භූමි ප්‍රමාණය පුරාවිද්‍යා රක්ෂිතයක් ලෙසට ගැසට් කිරීමේ කාර්යය සඳහා අවධානය යොමු කළ යුතුය. |

## 3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අභිලේඛන හා නාණක විද්‍යා අංශය මඟින් ප්‍රාදේශීය පුරාවිද්‍යා කෞතුකාගාරයන්හි ඇති පැරණි කාසි 10,950 සුවිගත කර පැවති අතර, ඒ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම හා විශාල කාලයක් ගතවීම හේතුවෙන් පුරාවිද්‍යාත්මක විවිධ කැණීම් වලදී හමු වූ වංචල පුරාවස්තු වන පෞරාණික කාසි විශාල ප්‍රමාණයක් තවදුරටත් දෙපාර්තමේන්තුවේ විවිධ අංශ හා ප්‍රාදේශීය කාර්යාල තුළ සංරක්ෂණය හා සුවිගත කිරීමකින් තොරව ගබඩා කර පවතින බව නිරීක්ෂණය විය. | පැරණි කාසි 10,950 ක් සුවිගත කර පැවති අතර, තවදුරටත් සංරක්ෂණය කිරීම සඳහා කෞතුකාගාර අංශය තුළ හා ප්‍රාදේශීය පුරාවිද්‍යා කෞතුකාගාරයන්හි විශාල කාසි ප්‍රමාණයක් පැවතිණි. | වංචල පුරාවස්තු කඩිනමින් ලේඛනගත කිරීමටත්, ඒවා ආරක්ෂා කිරීමටත් ක්‍රියා කළ යුතුය. |
| (ආ) | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් පාහියන්ගල ලෙනෙහි සිදුකරන ලද කැණීමෙන් හමු වූ මානව අස්ථි අවශේෂ පර්යේෂණ කටයුතු සඳහා කේම්බ්‍රිජ් සරසවියට ගෙන ගොස් පසුව ජර්මනියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ තිබී යළි | නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. | කැණීම් වලින් සොයා ගන්නා මානව අස්ථි අවශේෂ සුදුසු පරිදි සංරක්ෂණය කළ යුතු වන බව හා ඊට අදාල පහසුකම් සපයා ගත යුතු බව |

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකාවට රැගෙනවිත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත 2022 පෙබරවාරි 11 දින භාරදුන් බවටත්, නමුත් එම අස්ථි අවශේෂ ආරක්ෂිතව තබා ගැනීමට හා විධිමත් පර්යේෂණ කිරීමට සුදුසු රසායනාගාර පහසුකම් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සතු නොවීමත් හේතුවෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය වෙත ඉහත දිනැති ලිපිය මඟින් නැවත එදිනම භාරදී තිබූ බව නිරීක්ෂණය විය. | | |

## 3.3 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| PG – 4006 දරන කැබ් රථය 2018 ඔක්තෝම්බර් 09 දින මධ්‍යම රාත්‍රී මහනුවර ගන්නෝරුව ප්‍රදේශයේදී අනතුරට භාජනය වීම හේතුවෙන් වාහනයට සිදු වූ අලාභයේ මූල්‍ය තක්සේරු වටිනාකම වූ රු.5,882,769 ගෙවීම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් ඉහත වටිනාකමින් රාජ්‍ය දේපළකට හානි හා පාඩු සිදු වී පැවති බව නිරීක්ෂණය විය. | PG-4006 කැබ් රථයේ අනතුරට භාජනය වීම හේතුවෙන් වාහනයට සිදු වූ අලාභයේ වටිනාකම ගෙවීම රක්ෂණ සමාගම විසින් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් එම වටිනාකම අය කර ගැනීම සඳහා රියදුරුට එරෙහිව සිවිල් නඩුවක් ගොනු කිරීම සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නීති අංශය විසින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව දැනුම් දීමක් සිදු කර ඇති බවත් ඊට අදාළ ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බවත් නීති අංශය විසින් වාර්තා කර ඇත. | රජයට සිදු වූ අලාභය අදාළ පාර්ශවයෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. |

## 3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2004 මැයි 11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව වැටුප් සකස් කිරීම සඳහා වැටුප් සැකසීමේ මෘදුකාංගය (GPS – Government Payroll System) භාවිතා කළ යුතු වුවද, දෙපාර්තමේන්තුවේ යාපනය, වවුනියාව හා ත්‍රිකුණාමලය | එකඟ වෙමි. මානව සම්පත් ලද පසු ගණකාධිකාරීගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාකළ හැකි බව කාරුණිකව දන්වමි. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | යන ප්‍රාදේශීය කාර්යාල නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාත් GPS මෘදුකාංගය භාවිතා කර නොතිබුණි. එසේම වැටුප් සැකසීමේ කාර්යය ප්‍රධාන ගණකාධිකාරීගේ සෘජු අධීක්ෂණය යටතේ මධ්‍යගත ක්‍රමවේදයට අනුව සිදු කළ යුතු බැවින් ඒ සඳහා අවශ්‍ය මානව සම්පත් ප්‍රමාණවත් නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය. | | |
| (ආ) | පළාත් පුරාවිද්‍යා කාර්යාල වලට සහ ඊට අදාළ කලාප කාර්යාල වලට අනුයුක්ත සමස්ථ කාර්ය මණ්ඩලයේ වැටුප් වර්ධක ගෙවීම පිළිබඳ සිදු කරන ලද පරීක්ෂාවේදී 2015, 2018, 2019, 2020, 2021 වර්ෂ වලට අදාළ වැටුප් වර්ධක නොගෙවූ අවස්ථා පවතින බව නිරීක්ෂණය විය. | කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් නොවීම, අනෙක් රාජ්‍ය භාෂා අවශ්‍යතා සම්පූර්ණ නොකිරීම, විභාග ප්‍රතිඵල සනාථ කර ගැනීමට යොමු කර ඇතත් මෙතෙක් සනාථ කර නොපැමිණීම වැනි හේතු මත සමහර වැටුප් වර්ධක ගෙවා නොමැති අතර අනෙක් නිලධාරීන්ගේ වැටුප් වර්ධක ගෙවා ඇත. | පරීක්ෂා කර බලා කටයුතු කළ යුතු බව. |
| (ඇ) | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ අනුමත දෙපාර්තමේන්තුගත තනතුරු සඳහා ස්ථාන මාරු ක්‍රමවේදයක් 2017 තෙක්ම පිළියෙල කර අනුමත කරගෙන නොතිබුණි. එසේ වුවත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විධි විධාන වලට අනුකූලව පිළියෙල කළ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය සඳහා 2018 ජූලි 09 දින අනුමැතිය ලබාගෙන තිබුණි. එසේ වාර්ෂික ස්ථාන මාරු ක්‍රමවේදයක් සකස් කර අනුමැතිය ලබාගෙන තිබුණද, එම ක්‍රමවේදයට අනුව ස්ථාන මාරු කිරීම සඳහා නිලධාරීන් හා සේවකයින් තෝරා ගැනීමට ස්ථාන මාරු ඇගයීම් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. එසේම 2019, 2020, 2021 හා 2022 වර්ෂ වලදීද වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය ක්‍රියාත්මක කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත්ව තිබුණි. | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු දෙපාර්තමේන්තුගත තනතුරු සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක PSC/EST/02-04-08/01/2018 හා 2018 ජූලි 09 දිනැති ලිපිය මඟින් 2018 ජූලි 03 දිනැතිව වාර්ෂික ස්ථාන මාරු පරිපාටිය අනුමත කර පැවති නමුත්, 2020, 2021 හා 2022 වර්ෂ වල පැවති රටේ අයහපත් වාතාරවරණය හේතුවෙන් සැලසුම් කළ පරිදි ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමට නොහැකි වී පැවතුණි. | වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රමවේදය දෙපාර්තමේන්තුව තුළ විධිමත් පරිදි ක්‍රියාත්මක කළ යුතු වන බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ පාලනය හා කළමනාකරණය කරනු ලබන සංචාරක නිවාස 13 සඳහා අයකරනු ලබන ගාස්තු පිළිබඳව තීරණය කිරීමේදී, පාලන අංශය, ගිණුම් අංශය හා නඩත්තු අංශය නියෝජනය වන පරිදි කමිටුවක් පත් කර එම කමිටු තීරණය මත ගාස්තු සංශෝධනය කළ යුතු වුවද, එසේ කටයුතු නොකර නඩත්තු අංශයේ තීරණය මත පමණක් ගාස්තු සංශෝධනය කර තිබුණි. | එකඟ වෙමි. ඉදිරියේදී විධිමත් කමිටුවක් පත් කර ගාස්තු සංශෝධනය කිරීමට කටයුතු කිරීම සඳහා සටහන් කරගත් බව කාරුණිකව දන්වමි. | පත්කරනු ලබන කමිටුවේ තීරණය පරිදි සංචාරක නිවාස වල ගාස්තු තීරණය කළ යුතු වේ. |
| (ඉ) | මඩකලපුව දිස්ත්‍රික්කයේ ගැසට් කරන ලද පුරාවිද්‍යා ස්ථාන 03 ක් සහ ගැසට් නොකරන ලද පුරාවිද්‍යා ස්ථාන 122 ක් ඇතුළු පුරාවිද්‍යා ස්ථාන 125 ක් වෙනුවෙන් පුරාවිද්‍යා මාර්ග සංඥා නාම පුවරු 125 ක් සකස් කිරීම වෙනුවෙන් 2020 ජුලි 17 දින රු.1,806,250 ක් සැපයුම්කරු වෙත ගෙවා තිබුණි. නමුත්, 2023 අප්‍රේල් 28 දින වන විටත් ගැසට් කරන ලද ස්ථාන 03 ක් සඳහා පමණක් පුවරු සවි කර පැවති බව හා ඉතිරි පුවරු 122 සිටුවීම සඳහා අවශ්‍ය අනුමැතිය ලැබී තිබුණත්, ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් කාර්යය ඉටු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | මඩකලපුව දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යා ස්ථාන ක් 125 සඳහා පුවරු සාදා තිබුණත් ක්ෂ අධ්‍යාහිටපු පුරාවිද්‍යා ජනරාල් අනුමත කර තිබුණේ ගැසට් කරන ලද පුරාවිද්‍යා ස්ථාන වලට පමණක් පුවරු යොදන ලෙසයඡ් අනුව ගැසට් . ස්ථානකරන ලද පුරාවිද්‍යා ක් පැවති අතර එය සඳහා 03 ක් සිටුවීම කරන 03 පුවරු 122 ලද අතර ඉතිරි පුවරු සිටුවීම සඳහා මා විසින් අනුමැතිය ලබා දී .ඇත නමුත් මේ වන විට දෙපාර්තමේන්තුවේ තිපාදන නොප්‍රමැති වීම මත මෙම කාර්යය සිදුකිරීම තාවකාලිකව නවතා ඇත. | සකස් කරන ලද පුරාවිද්‍යා මාර්ග සංඥා නාම පුවරු කඩිනමින් සවි කළ යුතු වන බව. |
| (ඊ) | 2017/2018 වර්ෂ වලදී නැගෙනහිර පළාත් විශේෂ කාර්යය බලකාය යනුවෙන් බලකායක් පත් කර දෙපාර්තමේන්තුවේද සහය ඇතුව නැගෙනහිර සියළු පුරාවිද්‍යා ස්ථාන හඳුනාගෙන එම ස්ථාන වෙන් කර හඳුනා ගැනීම සඳහා මායිම් කණු දැමීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වී පැවතිණි. එම ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේදී MNT/EP/49/18 ඇස්තමේන්තුව යටතේ රු.7,306,933 ක ප්‍රතිපාදන වෙන් කරගෙන පැවති අතර, 2021 වර්ෂයේදී සැපයුම්කරුට රු.2,626,796 ක් ගෙවීම් කර අඩි 3 හා | 2017-2018 වර්ෂ වලදී නැගෙනහිර පළාත් සියළුම පුරාවිද්‍යා ස්ථාන හඳුනාගෙන, එම ස්ථාන වෙන් කර හඳුනා ගැනීම සඳහා මායිම් කණු දැමීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වූ අතර, එම ව්‍යාපෘතිය යටතේ 2018 වර්ෂයේදී රු.7,306,933 ක ඇස්තමේන්තු ප්‍රතිපාදන වෙන් කරගෙන දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව මායිම් | නැගෙනහිර පළාතේ හඳුනාගත් සියළු පුරාවිද්‍යා ස්ථානවල ඇති පුරාවස්තු ආරක්ෂා කර ගැනීම සඳහා මායිම් කණු දැමීම අත්‍යාවශ්‍ය කටයුත්තක් බව. |

| | | | |
|---|---|---|---|
| | අඩි 3 ½ මායිම් කණු 1,531 ක් සකස් කර පැවති නමුත්, 2023 මාර්තු 20 විගණිත දින දක්වා අදාළ පුරාවිද්‍යා ස්ථාන වලට මායිම් කණු ස්ථාපිත කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී පැවති බව නිරීක්ෂණය විය | කණු සකස් කර පැවතුණත්, 2020, 2021 කොවිඩ් වසංගත තත්ත්වය හා කාර්ය සාධන බලකාය අක්‍රීය වීම හේතුවෙන් බලාපොරොත්තු වූ පරිදි කාර්යය ඉටු කිරීමට නොහැකි විය. | |
| (උ) | දීඝවාපී චෛත්‍ය සංරක්ෂණය සඳහා 2013 – 2014 වර්ෂ වලදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් ලබාගෙන ඇති ඉංජිනේරු ගඩොල් 377,000 ක් නිසි තාක්ෂණික වාර්තා නොමැතිව මිලදී ගෙන පැවති හෙයින් ඒ පිළිබඳව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් පරීක්ෂණයක් පැවැත්වීම හා ඒ පිළිබඳ අවසන් තීන්දුවක් ලබාදී නොමැති වීම හේතුවෙන් වර්ෂ 10 කට අධික කාලයක් තිස්සේ කාලගුණික විපර්යාස වලට භායනය වෙමින් විශාල ගඩොල් අට්ටි කිහිපයකට වෙන් කර චෛත්‍ය වටා ඇති සලපතල මළුව හා වැලි මළුව ආශ්‍රිතව ගොඩ ගසා පැවති බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | මෙම ගඩොල් මිලදී ගැනීම පිළිබඳ අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාව මඟින් පරීක්ෂණයක් සිදුකිරීම නිසා ක්ෂේත්‍රයේ ගබඩාකර තිබූ නමුත් ඒ පිළිබඳව අවසන් තීරණයක් එම කොමිසම මඟින් මෙතෙක් ලබා දී නොමැති අතර එම ගඩොල් මිලදී ගැනීම හේතුවෙන් සිදු වූ අලාභය අවම කරගැනීම සඳහා ඒවා චෛත්‍ය ඉදිකිරීම හැර වෙනත් කාර්යයකට භාවිතා කිරීම සඳහා අවසර ඉල්ලා තිබුණි. ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික වාර්තාව 2022.10.27 වන දින අල්ලස් කොමිසම වෙත යවා ඇත. මේ පිළිබඳව කිහිපවතාවක්ම දුරකථනයෙන් අමතා විමසීම් කළ ද පිළිතුරු ලබා දී නොමැති බව අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ශාස්ත්‍රීය) විසින් මා වෙත වාර්තාකොට ඇත. කඩිනමින් ගැටළුව විසඳීමට අවශ්‍ය පියවර ගැනීමට සටහන් කරගත් බව කාරුණිකව දන්වමි. | ගැටළුව විසඳීමට කඩිනමින් අවශ්‍ය පියවරගත යුතු වන බව. |
| (ඌ) | දීඝවාපී දාගැබ ප්‍රතිනිර්මාණය කිරීමේ කාර්යය සඳහා Rotatable arched template එකක් නිෂ්පාදනය කරවා ගැනීම පිණිස පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව අතර 2019 නොවැම්බර් 25 දින ගිවිසුම්ගතව පැවති අතර, මෙම කාර්යය ඉටු කරවා ගැනීම සඳහා වන කොන්ත්‍රාත් වටිනාකම වැට් හැර රු.4,147,400 ක් වී පැවතිණි. කාර්යය | Rotatable arched template නිෂ්පාදනය කිරීම සඳහා 2019 වර්ෂය වන විට රජයේ කර්මාන්ශාලාව සමඟ ගිවිසුම්ගතව තිබූ නමුත්, පසුව එම ක්‍රමවේදයෙන් බැහැරව මිනුම් උපකරණ මඟින් මිණුම් ලබා ගැනීමේ ක්‍රමවේදය යටතේ චෛත්‍ය ප්‍රතිනිර්මාණ කටයුතු ආරම්භ කළ බැවින් Rotatable | ගැටළුව විසඳීමට කඩිනමින් අවශ්‍ය පියවරගත යුතු වන බව හා මුදල් කාර්යක්ෂමව භාවිතා කළ යුතු බව |

| | | | |
|---|---|---|---|
| | ආරම්භ කිරීම සඳහා වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වශයෙන් සියයට 50 කට වඩා වැඩි වූ රු.2,239,596 ක මුදලක් 2020 අගෝස්තු 25 දින හා චෙක්පත් අංක 428281 මඟින් අධ්‍යක්ෂ ජනරාල් රජයේ කර්මාන්තශාලාව වෙත ගෙවා පැවති නමුත්, පසුව එම කාර්යය ආරක්ෂක අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කිරීම හේතුවෙන් එය මිනුම් උපකරණ මඟින් මිනුම් ලබා ගැනීමේ ක්‍රමවේදය අනුව සිදු කිරීමට තීරණය තිබුණි. අත්තිකාරම් මුදලක් ගෙවා ඇති හෙයින් සහ අවශ්‍ය යකඩ යම් ප්‍රමාණයක් සකස් කර ඇති හෙයින් චෛත්‍ය ඉදිකිරීමෙන් පසු අවශ්‍ය නඩත්තු කාර්යයන් සිදු කිරීම සඳහා ප්‍රයෝජනයට ගත හැකි, ගලවා ඉවත් කළ හැකි තරප්පු පෙළක් නිම කිරීම සඳහා එම ලෝහ කොටස් භාවිතා කිරීමට යෝජනා කර තිබුණි. | arched template සකස් කිරීම අවශ්‍ය නොවුණු හෙයින් ඒ සඳහා ගෙවූ අත්තිකාරම් මුදල් හා යකඩ අච්චුව සකස් කිරීමට කැබලි කර තිබූ යකඩ භාවිතා කර දීඝවාපී චෛත්‍ය නඩත්තු කටයුතු වලට අවශ්‍ය ගලවා ඉවත් කළ හැකි තරප්පු පෙළක් සකස් කිරීමට යෝජනා වී පැවතිණි. | |
| (එ) | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය පිහිටි දේපලෙහි අයිතිය පවරා ගැනීමට ඉදිරි කටයුතු සිදුකර පැවති නමුත් එම කටයුතු අවසන් කිරීමකින් තොරව ප්‍රධාන කාර්යාලය පිහිට ඉඩම පවරා ගැනීමේ කටයුතු විගණන අවස්ථාව දක්වා අවසන් කර නොමැති බව නිරීක්ෂණය විය. | දේපළ පවරාගැනීමේ කටයුතු තවදුරටත් සිදුකරමින් පවතින බව කාරුණිකව දන්වමි. | ප්‍රධාන කාර්යාලය පිහිටි දේපලෙහි අයිතිය පවරා ගැනීමේ කටයුතු නිම කිරීමට කඩිනමින් පියවරගත යුතු වන බව. |
| (ඒ) | මිය යාම, විශ්‍රාම යාම, වැඩ තහනම් කිරීම හා සේවය හැර යාම යනාදී හේතූන් මත දෙපාර්තමේන්තුවේ දැනට සේවයේ නොමැති සේවකයන්ගෙන් හා නිලධාරීන්ගෙන් අයවිය යුතු එකතුව රු.3,576,785 ක් වූ ණය ශේෂ අතුරින් වර්ෂ 05 කට වැඩි ණය ශේෂ වල එකතුව රු.1,329,920 ක් විය. එම හිඟ ණය ශේෂ අයකර ගැනීමට ප්‍රමාණවත් කටයුතු සිදුකර නොතිබුණි. | ගැටළුකාරී තත්ත්වයන් විසඳා ගනිමින් අයකර ගැනීමේ ක්‍රියාදාමයන් අනුගමනය කරමින් සිටී. | මෙම හිඟ ණය ශේෂ අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ඔ) | 1998 අංක 24 දරන පුරාවස්තු (සංශෝධන) පනතින් සංශෝධනය කරන ලද 1940 අංක 09 දරන පුරාවස්තු ආඥා පනතෙහි පවත්නා ඇතැම් වගන්ති කාලීනව සංශෝධනය නොවීමේ ප්‍රතිඵලයක් ලෙස අයකරනු ලබන දඩ මුදල් ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විණි. යථෝක්ත පනතෙහි වගන්ති උල්ලංඝනය පිළිබඳ | ශ්‍රී ලංකාවේ දැනට භාවිතා වන විශේෂ පනත් අතුරින් අල්ලස් පනත, විගණන පනත, වන ජීවී හා වෘක්ෂලතා ආඥා පනත් වැනි පනත් වල රජයේ නිලධාරීන්ට එරෙහිව නඩු පැවරීම (මුක්තිය) වළක්වන ආකාරයේ වගන්ති ඇතුළත්ව | පුරාවස්තු ආඥා පනත කාලීන අවශ්‍යතාවයන්ට සරිලන පරිදි සංශෝධනය විය යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | මහේස්ත්‍රාත් අධිකරණ වල පවරා ඇති නඩු වලදී ගොණු කරන ලද චෝදනා පත්‍රයට නිවැරදිකරු බව ප්‍රකාශ කර නඩු විභාගය අවසන් වීමෙන් පසු චූදිත / චූදිතයා අදාළ චෝදනා වලින් නිදොස් කොට නිදහස් කිරීමෙන් පසු සද්භාවයෙන් තම රාජකාරිය ඉටු කළ රාජ්‍ය නිලධාරීන්ට එරෙහිව වන්දි ඉල්ලා නඩු පැවරීම වැළැක්වීම සඳහා ප්‍රතිපාදන කිසිවක් පුරාවස්තු ආඥා පනතෙහි නොමැති වීම හේතුවෙන් සමහර අවස්ථා වලදී පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් සහ ස්ථාන පරීක්ෂණයට ගිය නිලධාරීන් වගඋත්තරකරුවන් කර වන්දි ඉල්ලා නඩු පවරා ඇති අවස්ථා විගණනය වෙත නිරීක්ෂණය විය. | පැවතියත් 1998 අංක 24 දරන පුරාවස්තු (සංශෝධන) පනතින් සංශෝධනය කරන ලද 1940 අංක 09 දරන පුරාවස්තු ආඥා පනතේ එවැනි වගන්ති ඇතුළත් නොවීම හේතුවෙන් සද්භාවයෙන් රාජකාරී ඉටු කරන රාජ්‍ය නිලධාරීන් ට එරෙහිව නඩු පැවරීම සිදුකර පැවතිණි. | |
| **(ඕ)** | 1998 අංක 24 දරන පුරාවස්තු සංශෝධන පනතින් සංශෝධනය වූ 1940 අංක 09 දරන පුරාවස්තු ආඥා පනතේ 46 (1) අනුව ක්‍රියාත්මක වීමේ ප්‍රමාදයන් පැවතීම හේතුවෙන් යථෝක්ත ආඥා පනත යටතේ නඩු පැවරීමෙන් පසු විත්තිකරුවන් වෙත නියම කරනු ලබන දඩ මුදලෙන් අඩක් පුරාවිද්‍යා තෑගි අරමුදලට බැර කළ යුතුය. මේ වන විට සකස් කර ඇති යථෝක්ත රෙගුලාසි ඇතුළත් කෙටුම්පත මඟින් නීති කෘත්‍යයන්හි නිරත වන වැටලීම් නිලධරයන්, පොලිස් නිලධරයන් හෝ වෙනත් යම් රාජ්‍ය ආයතනක හෝ පළාත් පාලන ආයතනයක යම් නිලධරයන්ට සියයට 30 ක ප්‍රතිශතයක් ලබාදීම සඳහා විධි විධාන සලසා පැවති නමුත්, අදාළ රෙගුලාසි ඇතුළත් කෙටුම්පත පුරාවස්තු ආඥා පනතේ 47 (3) ප්‍රකාරව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු වුවත්, එහි ප්‍රමාදයක් පැවතීම හේතුවෙන් විශේෂයෙන්ම පොලිස් නිලධාරීන් ඉල්ලනු ලබන තෑගි අරමුදල් ප්‍රතිශත ඔවුන් වෙත ලබාදීමට නොහැකි වී තිබුණි. | 2023 අප්‍රේල් 24 දින වන විට පුරාවස්තු සොරකම් කිරීම සම්බන්ධ නඩු 07 ක්ද, පුරාවස්තු විනාශ කිරීම සම්බන්ධයෙන් නඩු 06 ක්ද සහ පුරාවස්තු අනවසර කැණීම් සිදු කිරීම සම්බන්ධ නඩු 155 ක්ද වශයෙන් වෙනස් වී පැවතුණි. | අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සකස් කර ගැනීම සඳහා කටයුතු කිරීමට අවධානය යොමු කළ යුතු බව |

**3.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ භාවිතා කරන රථ වාහනවල බඳෙහි රාජ්‍ය ලාංඡනය සහ දෙපාර්තමේන්තු නාමය මුද්‍රිතව සටහන් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව සතු රථ වාහනවල බඳෙහි රාජ්‍ය ලාංඡනය සහ දෙපාර්මේන්තු නාමය මුද්‍රණය කිරීම සඳහා ඉදිරියේ දී කටයුතු කරන බව දන්වමි. | කඩිනමින් රාජ්‍ය ලාංඡනය හා දෙපාර්තමේන්තු නාමය රථ වාහන වල බඳෙහි යෙදීමට පියවරගත යුතු වන බව. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය අතර ඇතිකරගත් ගිවිසුමක් යටතේ ආයතන දෙක අතර ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස 2012 වසරේ සිට ක්‍රියාත්මක වෙමින් පැවති මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.323,897,373 ක් වූ රජගලතැන්න පුරාවිද්‍යා ව්‍යාපෘතිය 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කර තිබුණි. මෙම ව්‍යාපෘතියෙන් මතුකරගෙන පවතින පුරාවිද්‍යා ස්මාරක නැරඹීම සඳහා දේශීය මෙන්ම විදේශීය සංචාරක ප්‍රවර්ධනය සඳහා අදාළ නියාමන ආයතන සමඟ ඒකාබද්ධව කටයුතු කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දීමට අමතරව යෝජිතව පවතින ඉදිකිරීම් කඩිනමින් නිමා කිරීමේ අවශ්‍යතා පවතින නමුත්, ඒ සඳහා විශාල කාල ප්‍රමාදයන් පවතින බවත්, එසේම සංචාරක කර්මාන්තය දියුණු කිරීම උදෙසා ප්‍රධාන සංචාරක සංධිස්ථානයක් ලෙස රජගලතැන්න ස්ථාපිත කිරීම සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මධ්‍යම සංස්කෘතික අරමුදල, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, වන ජීවී දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය සමඟ ඒකාබද්ධව කටයුතු කිරීමේ ක්‍රමවේදයන් සකස් කර ක්‍රියාත්මක කිරීමෙන් රටේ වර්තමානයේ ඇති වී පවතින දැඩි මූල්‍ය අර්බුධයට මූල්‍ය සහනයක් ළඟා කර දීමට රාජ්‍ය අංශයේ යම් දායකත්වයක් ලබාදීම සිදු කළ හැකි බව නිරීක්ෂණය විය. | නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. | කඩිනමින් අවශ්‍ය පියවර ගත යුතු වන බව. |

## 5. යහපාලනය

### 5.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2008 මාතර කඹුරුගමුව ඇත් කඳ විහාරයේ අවට සිදු කරන ලද පුරාවිද්‍යා ගවේෂණයේදී විහාරස්ථානයට යාබද පෞද්ගලික ඉඩමේ පුරාවස්තු පරීක්ෂා කිරීමට එම ස්ථානයට ගිය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ රාජකාරියට පුද්ගලික ඉඩමේ හිමිකාරිය බාධා කිරීම සම්බන්ධයෙන් මාතර පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබුණි. මේ පිළිබඳව මාතර පොලීසිය විසින් මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 90759 දරන නඩුව පවරා තිබුණි. නඩු විභාගයෙන් පසුව විත්තිකාරිය නිදොස් කොට නිදහස් කර තිබුණු අතර, විත්තිකාරිය විසින් මාස 08 ක කාලයක් බන්ධනාගාරගත වීම හේතුවෙන් ඇයට සිදු වූ පාඩුව වෙනුවෙන් එක් අයෙකුගෙන් ලක්ෂ 10 බැගින් වන්දි ඉල්ලා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ගවේෂණ නිලධාරියෙකුට හා පුරාවිද්‍යා පර්යේෂණ නිලධාරීන් 02 කුට විරුද්ධව මාතර දිසා අධිකරණයේ අංක M13703 දරන නඩුකරය පවරා තිබුණි. | මෙම නඩුවේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ තිදෙනෙක් සහ ග්‍රාම නිලධාරීවරයෙක් ඇතුළුව 6 දෙනෙකු වගඋත්තරකරුවන් ලෙස නම් කර ඇත. 6 වැනි වගඋත්තරකරු ලෙස නීතිපතිවරයා නම්කර ඇත. මෙම නඩුවේ මා වගඋත්තරකරුවකු ලෙස නම් කර නැත. එක් වගඋත්තරකරුවකුගෙන් රු. ලක්ෂ 10 බැගින් වන්දි ඉල්ලා ඇත. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් කරන ලද විශේෂ ඉල්ලීමකට අනුව මෙම නඩුවේ වගඋත්තරකරුවන් වෙනුවෙන් ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥවරියක් පෙනී සිටියි. මෙම නඩුව 2015 වසරේදී පවරා ඇති අතර නඩුවේ පැමිණිල්ලේ සාක්ෂි සියල්ල අවසන් කර ඇත. ඊළඟ පියවර වන්නේ වගඋත්තරකරුවන්ගෙන් සාක්ෂි ලබාගැනීමයි. 2023.01.18 දින පළවැනි වගඋත්තරකරුගෙන් සාක්ෂි විමසීම සිදුකරන ලදි. නැවත වැඩිදුර විභාගය සඳහා 2023.06.20 දිනය ලබා දී ඇති බව කාරුණිකව දන්වමි. | දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සද්භාවයෙන් රාජකාරී කිරීමේදී ඇති වන ගැටළු වලදී අදාළ නිලධාරීන්ගේ ආරක්ෂාව සඳහා පියවරගත යුතු වන බව. |
| (ආ) | හපුතලේ පොලිස් වසමේ පිහිටා ඇති හල්දුම්මුල්ල සොරගුණේ කතරගම දේවාලය පිහිටි භූමියේ අනවසර කැණීම් සිදු කළ විත්තිකරුවන් තිදෙනෙකුට එරෙහිව හපුතලේ පොලීසිය විසින් බණ්ඩාරවෙල මහේස්ත්‍රාත් අධිකරණයේ 2014 වර්ෂයේ පවරන ලද අංක 63402 | මෙය මා ඇතුළු 4 දෙනෙකු වගඋත්තරකරුවන් ලෙස නම් කරමින් 2016 වසරේදී පවරා ඇති නඩුවකි. එක්අයෙකුගෙන් රු. කෝටි 7 බැගින් වන්දි ඉල්ලා ඇත. මෙම නඩුව සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥවරයෙකු පෙනී සිටින | දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සද්භාවයෙන් රාජකාරී කිරීමේදී ඇති වන ගැටළු වලදී අදාළ නිලධාරීන්ගේ ආරක්ෂාව සඳහා පියවරගත යුතු වන බව. |

| | | | |
|---|---|---|---|
| | දරන නඩුව විභාග කිරීමෙන් පසුව 2014 ජූනි 03 දින විත්තිකරුවන් නිදොස් කොට නිදහස් කර තිබුණි. පසුව විත්තිකරුවන් විසින් ඔවුන් බන්ධනාගාරගතව සිටි කාලසීමාවට අදාළව සිදු වූ පීඩාව සම්බන්ධයෙන් වන්දි ලබා ගැනීම සඳහා බණ්ඩාරවෙල දිසා අධිකරණයේ අංක **M** 4251 දරන නඩුව පවරා තිබුණි. මෙම නඩුවේදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දෙදෙනෙක්, පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා, ග්‍රාම නිලධාරීවරයා සහ පන්සලේ ස්වාමීන් වහන්සේ වග උත්තරකරුවන් ලෙස නම් කරමින් එක් අයෙකුගෙන් රුපියල් කෝටි 07 බැගින් වන්දි ඉල්ලා තිබුණි. | අතර තවමත් විභාගවෙමින් පවතින බව කාරුණිකව දන්වමි. | |
| (ඇ) | පුරාවස්තු පනත උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් පුරාවස්තු සොරකම් කිරීම සම්බන්ධව නඩු 07 ක්ද, පුරාවස්තු විනාශය සම්බන්ධයෙන් නඩු 03 ක්ද, පුරාවස්තු අනවසර කැණීම් සම්බන්ධව නඩු 152 ක්ද, පනතට ගැනෙන වෙනත් වැරදි සම්බන්ධව නඩු 11 ක්ද වශයෙන් 2022 දෙසැම්බර් 31 දිනට පැවති සමස්ථ නඩු පැවරීම් සංඛ්‍යාව 173 ක් විය. තවද, විගණිත දිනට අධිකරණයේ විභාග වෙමින් පවතින නඩු සංඛ්‍යාව 72 ක් වී පැවති බව නිරීක්ෂණය විය**.** | 2023 අප්‍රේල් 24 දින වන විට පුරාවස්තු සොරකම් කිරීම සම්බන්ධ නඩු 07 ක්ද, පුරාවස්තු විනාශ කිරීම සම්බන්ධයෙන් නඩු 06 ක්ද සහ පුරාවස්තු අනවසර කැණීම් සිදු කිරීම සම්බන්ධ නඩු 155 ක්ද වශයෙන් වෙනස් වී පැවතුණි. | පුරාවස්තු සොරකම් කිරීම, හානි කිරීම් සහ විනාශ කිරීම් වැළැක්වීම සඳහා ගත යුතු සුදුසුම ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු අතර, ඒ පිළිබඳ වැඩි අවධානයක් යොමු කළ යුතුව තිබුණි. |

## 6. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 4318 ක්ද, තත්‍ය කාර්ය මණ්ඩය 1882 ක්ද වීම නිසා පුරප්පාඩු සංඛ්‍යාව 2476 ක් විය. මෙම පුරප්පාඩු අතර විධායක මට්ටමේ පුරප්පාඩු 39 ක්ද, තෘතියික මට්ටමේ පුරප්පාඩු 19 ක්ද, ද්විතීයික | 2022 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 4318ක්ද, තථ්‍ය කාර්ය මණ්ඩලය 1882ක් ද වීම නිසා පුරප්පාඩු සංඛ්‍යාව 2476ක් විය. මෙම පුරප්පාඩු අතර විධායක මට්ටමේ පුරප්පාඩු 39 ක්ද, තෘතියික මට්ටමේ පුරප්පාඩු 19 | බඳවා ගැනීම් පටිපාටිය සහ පවත්නා නීති රීති අනුව මෙම සේවක පුරප්පාඩු අවශ්‍යතාවය මත පදනම්ව කඩිනමින් සම්පූර්ණ කිරීමට ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මට්ටමේ පුරප්පාඩු 202 ක්ද, ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 2216 ක්ද පැවතුණි. මෙම පුරප්පාඩු සඳහා වැඩබලන සහ වැඩ ආවරණ වැනි පදනම් යටතේ සේවකයින් සේවයේ නියුක්ත කර තිබූ අතර, එම තනතුරු සඳහා ස්ථිරව බඳවා ගැනීමට නොහැකි වීම හේතුවෙන් අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 57 ක පුරප්පාඩු පැවතුන අතර මෙම පුරප්පාඩු පිරවීමට අපොහොසත් වී තිබුණි. | ක්ද, ද්විතියික මට්ටමේ පුරප්පාඩු 202ක් ද, ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 2216ක් ද පැවතුණි. ඒ අනුව අනුමත කාර්ය මණ්ඩලයෙන් 57% ක පුරප්පාඩු පැවතීම නිසා අපේක්ෂිත කාරයභාරය ඉටු කිරීමේදී විවිධ බාධාවන් ඇති වී තිබුණි. | |
| (ආ) | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත සේවා ගණයේ නිලධාරීන් පිරිසක් විසින් විධායක සේවා ගණයේ (SL-1) බඳවා ගැනීම් පටිපාටිය සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් කඩවීමක් සම්බන්ධයෙන් අංක SC (FR) 248/2016 ගොණු කර ඇති නඩුකරය 2021 දෙසැම්බර් 08 දින අවසන්ව පැවති නමුත්, විගණන අවස්ථාව දක්වා නඩු තීන්දුව ප්‍රකාශයට පත්කර නොතිබුණු බව නිරීක්ෂණය විය. නමුත්, මේ පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් කරන ලද විමසීමකට අදාළව එම දෙපාර්තමේන්තුව විසින් අංක CCA286/ 2016 (A) හා 2022 ඔක්තෝම්බර් 13 දිනැති ලිපිය මඟින් ඒ බව දන්වා ඇති බවත්, අදාළ බඳවා ගැනීම් පටිපාටියට අනුකූලව බඳවා ගැනීම් සිදු නොකරන ලෙසට අතුරු නියෝගයක් හා එසේම දෙපාර්තමේන්තුව වර්තමානයේ පත්ව ඇති ගැටළුකාරී තත්ත්වය පෙන්වා දෙමින් යථෝක්ත නඩුව මෝසමක් මඟින් නැවත කැඳවීමට කටයුතු කරන ලෙසට ඉල්ලීමක් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මඟින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර පැවති බවත් නිරීක්ෂණය විය. | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත සේවා ගණයේ නිලධාරීන් පිරිසක් විසින් විධායක සේවා ගණයේ )SL-1) බඳවාගැනීම් පටිපාටිය සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් කඩවීමක් සම්බන්ධයෙන් අංක SC (FR) 248/2016 ගොනුකර ඇති නඩුකරය දින 2021.12.08 අවසන්ව ඇති නමුත් මෙතෙක් .කාශයට පත් කර නැතතීන්දුව ප්‍ර මේ පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් කරන ලද විමසීමට අදාළව එම පාර්තමේන්තුව විසින් එවන ලද දෙ අංකCCA286/2016 (A) හා 2022.10.13 දිනැති ලිපිය මගින් ඒ බව දන්වා ඇති අතර අදාළ බඳවා ගැනීම් පටිපාටියට අනුකූලව බඳවා ගැනීම් සිදු නොකරන ලෙසට දන්වන ලද අතුරු නියෝගය ද එමගින් යොමු කර ඇත. | ගැටළුව විසඳීමට කඩිනමින් අවශ්‍ය පියවරගත යුතු වන බව. |